



# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# காணிசீர்திருத்தஆணைக்குழு

# Land Reform Commission

## ඉඩම් අමාත්‍යාංශය

## காணி அமைச்சு

## Ministry Of Lands

## වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය

## ஆண்டுறிக்ஜகமற்றும் குணக்குறிக்ஜக

# Annual Performance Report

# 2021

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2021


ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අංක 475

කඩුවෙල පාර


බත්තරමුල්ල

දුරකථන :0112144795

ෆැක්ස් : 0112878052

විද්‍යුත් තැපෑල : chairman@lrc.gov.lk

වෙබ් :www.lrc.gov.lk



## සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සංවර්ධන අරමුණු හා ඉලක්ක ප්‍රශස්ත අයුරින් සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන ප්‍රබලතම සම්පත වන ඉඩම් සම්පත සුළුතරයක් විසින් භුක්ති විඳීම වෙනුවට මෙරටේ සැබෑම උරුමකරුවන් වන මහජනතාව වෙත පත්කිරීමේ අරමුණින් දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් විසින් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවන ලදි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක 05කට ආසන්න වන මේ අවස්ථාවේ තවදුරටත් නීතීමය බැඳීම් අවසන් කිරීම, ඉඩම් වල පදිංචිව සිටින ජනතාවට ඔප්පු ලබාදීම, පූජනීය ස්ථාන වලට ඔප්පු ලබා දීම, රාජ්‍ය ආයතන විසින් භුක්ති විඳින ඉඩම් නියමානුකූල කිරීම මෙන්ම පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රැකී රක්ෂා ප්‍රවර්ධනය කිරීම සහ රාජ්‍ය ආදායම් උත්පාදනය තුළින් දේශීය කෘෂි ආර්ථිකය ගොඩනැගීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ඵලදායීව යොදා ගැනීම මෙන්ම නීති විරෝධී ක්‍රම වලින් බැහැර කර ඇති ඉඩම් හඳුනාගෙන ඒවා නැවත පනතේ අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා යොදවා ගැනීම තවදුරටත් කල යුතුව ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය ඉටු කිරීම සඳහා ගරු ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමාගේ උපදෙස් මත කඩිනමින් ඉහත ගැටළුවලට අවශ්‍ය විසඳුම් ලබා දීමට අවශ්‍ය සැලසුම් මේ වන විටත් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව, 2021 වර්ෂයට අදාළ කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

නීතීඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# පටුන


1. දළ විශ්ලේෂණය 1
   1.1 හැඳින්වීම 1
   1.2 දැක්ම මෙහෙවර සහ අරමුණු 2
      1.2.1 දැක්ම 2
      1.2.2 මෙහෙවර 2
      1.2.3 අරමුණු 2
   1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම 3
      1.3.1 කාර්යයන් 3
      1.3.2 සංවිධාන සැලැස්ම 4
   1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල 5
      1.4.1 ප්‍රධාන අංශයන් 5
      1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල 5
2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව 5
   2.1 ආයතන ස්ථාපනය 5
   2.2 කොමිෂන් සභාවේ සංයුතිය 5
   2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත් 5
3. ආංශික ප්‍රගතිය 6
   3.1 කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය 6
      3.1.1 කාර්යය මණ්ඩල සංයුතිය 6
      3.1.2 ආයතනික කටයුතු 7
      3.1.3 භෞතික සම්පත් කළමනාකරණය 8
   3.2 ඉඩම් අංශය 9
      3.2.1 ඉඩම් පැවරීම් අංශය 9
      3.2.2 ඉඩම් උපරිම සීමා අංශය 9
      3.2.3 තක්සේරු හා වන්දි අංශය 9
   3.3 නීති අංශය 10
      3.3 නීති අංශයේ කාර්යභාරය 10
   3.4 මුදල් අංශය 11
      3.4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම
         3.4.1.1 ආයතනික තොරතුරු
         3.4.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති
      3.4.2 අවසන් ගිණුම් වාර්තා - 2021 17
   3.5 අභ්‍යන්තර විගණක අංශය 21
      3.5.1 විගණනය සඳහා බලය 21
      3.5.2 වසර තුල ඉටු කරන ලද රාජකාරී 21
   3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල 21
      **ඇමුණුම** **23**

**A .ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

# 1. දළ විශ්ලේෂණය

## 1.1 හැඳින්වීම

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට 1972 දක්වා විහිදී යන ඉතිහාසයක් ඇත.

අවුරුදු 44 ක් පුරා කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදී. ඉඩම් හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන වලට යෙදවීම කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම, සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ.

වර්තමාන ශ්‍රී ලංකාවේ පෙරළිකාර දේශපාලන ගමන් මඟ සාර්ථක කරමින් රජයේ අරමුණු හා ප්‍රතිපත්ති වලට අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවෙල යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාවේ කටයුතු මෙහෙයවීමට කටයුතු සම්පාදනය කර ඇත.

තවද, මෙම වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිතතාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම ආරම්භ කිරීමට ද කටයුතු සම්පාදනය වෙමින් පවතී.

2021 වසර තුල පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිෂන් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම

ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම

iii. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙල යටතේ කොමිෂන් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර තිබූ වැඩසටහන නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම

iv. ආදයම් වැඩිකිරීමේ වැඩසටහන්

*a)* රණවිරු සේවා අධිකාරිය

*b)* රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම

*c)* රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම

*d)* බදු පදනම මත පුද්ගලයන්ට පැවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම

*e)* කළුගල් බදු දීම හා ඊට ආදායම් රැස්කිරීම

*f)* මැණික් ඉඩම් වලට අදාලව නව රෙගුලාසි පනවා ආදායම් රැස්කිරීම

*g)* සිලිකා, ඩොලමයිට්, වැලි ආදි ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම් වලින් ආදායම් ලබා ගැනීම

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියළුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුළු පැවැත්වීම ද ආරම්භ කරන ලදී. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී.

රජයේ ප්‍රතිපත්ති වලට අදාලව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස සලකා නිරතුරුවම සාකච්ඡා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු පසුවිපරම් කිරීමද සිදුව ඇත. තවද, මහජනයාගේ විවිධ ගැටළු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කල කමිටු මඟින් සෘජු සාකච්ඡාවක් පවත්වා කඩිනම් තීරණ ගැනීම ද සිදු වී ඇත.

මීට අමතරව එලදායි ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටුවේ නිර්දේශය මත ක්‍රියා කිරීම ආරම්භ කිරීමට ද කටයුතු කර ඇත.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ කඩිනම් මෙහෙයවීම උපදෙස් සහ මහ පෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් ඉඩම් අතුරෙන් ගිලිහි ගොස් ඇති සම්පත් වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීමට ද කටයුතු කර ඇත.

## 1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

### 1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරියට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායිතාවය ඉහළ නංවමින් ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින් ද, ඉඩම් උපරිමය කලානුරූපව බලාත්මක කරමින් ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතු වල ආයෝජනය කරමින් ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කල හැකි ඉඩම් සංචිතයක් පවත්වා ගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායක වීම.

### 1.2.3 අරමුණු

i. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශි කිරීම.
   - *a)* ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම
   - *b)* මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම
   - *c)* පැවරීම් කල ද එම කාර්යය ඉටු නොවන්නේ නම් එම ඉඩම් කොමිෂන් සභාව සතු කර ගැනීම

ii. කොමිෂන් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ,
   - a) ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නීතිමය බැඳීම් නිදහස් කිරීම
   - b) උපරිමයට වැඩි ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා ගැනීම
   - c) පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම
   - d) ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

iii. රටේ ආර්ථිකය සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායි ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම.

iv. කොමිෂන් සභාව සතු ඉඩම් වලින් ලැබිය යුතු ආදායම් රැස්කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිවට දායකත්වය ලබාදීම.

## 1.3 කාර්යභාරය සහ සංවිධාන සැලැස්ම

### 1.3.1 කාර්යයන්

i. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයෙකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.

ii. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.

iii. පනත් වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.

iv. කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.

v. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.

vi. ඉඩම් ලේඛනය යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශි කිරීම.

   a) ප්‍රකාශ කර ඇති නමුත් හඳුනා ගෙන නොමැති ඉඩම්

   b) උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්

   c) පවරා දී ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්

vii. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.

   a) ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

   b) කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම

   c) කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම

viii. රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම.

   a) ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම

   b) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

   c) ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම

   d) ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම

   e) රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම

ix. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

   a) භූමියේ ඇති සම්පත් වලින් ආදායම් රැස් කිරීම

   b) බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම

   c) රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අයකර ගැනීම

x. ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම.

   a) පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම


   b) විධිමත් රාජකාරි පැවරුමක් කිරීම

   c) බලතල විමධ්‍යගත කරමින් රාජකාරි පැවරුමක් කිරීම

   d) සාකච්ඡා, වැඩමුළු, පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම

xi. ආයතනයේ කාර්යක්ෂම ඵලදායිතාවයක් ඇති කරලීමට භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

## 1.3.2 සංවිධාන සැලැස්ම



### 1.4 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

#### 1.4.1 ප්‍රධාන අංශයයන්

i. කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
ii. ඉඩම් අංශය
iii. මුදල් අංශය
iv. නීති අංශය

#### 1.4.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ.

## 2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

### 2.1 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මඟින් පිහිටුවා ඇත.

### 2.2 කොමිෂන් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.

| | | | |
|---|---|---|---|
| i. | ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන | - | සභාපති |
| ii. | ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් | - | 05 |
| iii. | නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයින් | - | 03 |

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා මණ්ඩලය මඟින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිෂන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2021.12.31 දින දක්වා කොමිෂන් සභා මණ්ඩල රැස්වීම් 766 ක් පවත්වා ඇත.

### 2.3 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංසකරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශීය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම් වලින් හා රුපියල් සමාගම් වලින් ඉඩම් අක්කර 1,048,208 රූඩ් 2 පර් 01 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින් ද
ii. විධිවිධානයන් - අංක iv, v හා vi පනත් වලින්ද සලසා ඇත.

# 3. ආංශික ප්‍රගතිය

## 3.1 කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

### 3.1.1 කාර්ය මණ්ඩල සංයුතිය

වගුව 3.1: 2021 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

| අනු අංකය | තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | ප්‍රවර්තන වර්ෂයේ සිටි සංඛ්‍යාව (2021) | අතිරික්තය/ ඌණතාවය |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 (වැ.බ) | (01) |
| 2. | ලේකම්/අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 (වැ.බ) | (01) |
| 3. | අධ්‍යක්ෂ (මූදල්) | 01 | 01 | - |
| 4. | අධ්‍යක්ෂ (ඉඩම්) | 01 | 01 | - |
| 5. | අධ්‍යක්ෂ (නීති) | 01 | 01 | - |
| 6. | අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා විමර්ශන) | - | 16 | 16 |
| 7. | අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| 8. | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 01 | 01 | - |
| 9. | සහකාර අධ්‍යක්ෂ (මූදල්) | 02 | 02 | - |
| 10. | සහකාර අධ්‍යක්ෂ (නීති) | 03 | 06 | 03 |
| 11. | සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | 01 | 01 | - |
| 12. | සහකාර අධ්‍යක්ෂ (කලාප) | 20 | 16 | (04) |
| 13. | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති) | 01 | 02 | 01 |
| 14. | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා) | 01 | 01 | - |
| 15. | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම්) | 01 | 03 | 02 |
| 16. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි) | 01 | 01 | - |
| 17. | සහකාර අධ්‍යක්ෂ (මැණුම්) | 01 | 01 | - |
| 18. | ගිණුම් නිලධාරි | 01 | - | 01 |
| 19. | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 20. | තොරතුරු තාක්ෂණ නිලධාරි | 01 | 01 | - |
| 21. | පුද්ගලික සහකාර | 01(පුද්ගලික වන සේ) | 01 | - |
| 22. | තක්සේරු නිලධාරි | 03 | 03 | - |
| 23. | මාණ්ඩලික සහකාර | 23 (පුද්ගලික වන සේ) | 18 | - |
| 24. | ගිණුම් නිලධාරි | 05(පුද්ගලික වන සේ) | 04 | - |
| 25. | සැලසුම් ශිල්පි | 02 | - | (02) |
| 26. | ප්‍රවාහන සහකාර | 01 | 01 | - |
| 27. | කළමනාකරණ සහකාර | 215 | 396 | 181 |
| | | 40 (පුද්ගලික වන සේ) | | - |
| 28. | රියදුරු | 17 | 16 | 01 |
| 29. | කාර්යාල සහයක | 44 | 56 | 12 |
| | **එකතුව** | **392** | **516** | |

### 3.1.2 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්ය සාධනය 3.2 වගුව මඟින් ඉදිරිපත් කොට ඇත.

**වගුව 3.2: 2021 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු**

| අනු අංකය | විස්තර | පෙර වර්ෂය (2020) | | | ප්‍රවර්තන වර්ෂය (2021) | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඉල්ලීම් සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | ඉල්ලීම් සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
| 1. | සේවයට බඳවා ගැනීම් | 31 | 31 | - | 191 | 66 | - |
| 2. | විභාග පැවැත්වීම් | - | - | - | - | - | - |
| 3. | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම් | 01 | 01 | - | 08 | 08 | - |
| 4. | සේවය ස්ථිර කිරීම් | - | - | - | - | 02 | - |
| 5. | උසස් කිරීම් | - | - | - | 05 | 05 | - |
| 6. | වැටුප් වර්ධක ගෙවීම් | 205 | 205 | - | - | 287 | - |
| 7. | සේවය දිර්ඝ කිරීම් | 03 | 03 | - | - | - | - |
| 8. | බඳවා ගැනීමේ පරිපාටි සැකසීම් | - | - | - | 01 | - | 01 |
| 9. | සේවය හැරයෑම් | 05 | 05 | - | 10 | 10 | - |
| 10. | වැඩ තහනම් කිරීම් | 01 | 01 | - | - | - | - |
| 11. | නැවත සේවයේ පිහිටුවීම් | - | - | - | 04 | 02 | - |
| 12. | විනය පරීක්ෂණ | 01 | 01 | - | 04 | 02 | - |
| 13. | විදේශ නිවාඩු අනුමත කිරීම් | - | - | - | - | - | - |
| 14. | පුහුණු කිරීම් | 07 | 07 | - | - | 01 | - |
| 15. | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | - | - | - |
| 16. | ඇප ආරම්භ කිරීම් | - | - | - | - | - | - |
| 17. | ඇප නිදහස් කිරීම් | 06 | - | - | 01 | 07 | - |
| 18. | ණය අනුමත කිරීම්<br>I. දේපල<br>II. වාහන<br>III. වෙනත් | -<br>-<br>86 | -<br>-<br>86 | -<br>-<br>- | -<br>-<br>129 | -<br>-<br>128 | -<br>-<br>- |

### 3.1.3 භෞතික සම්පත් කළමනාකරණය

3.3 වගුව මඟින් 2021 වර්ෂයේ කොමිෂන් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත.

**වගුව 3.3 : භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු**

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුල සිදු වූ වෙනස්කම් | | වසර අවසානයේ පැවති තත්වය |
|---|---|---|---|---|---|
| | | | විකිණීම් | මිලදී ගැනීම් | |
| 1. | කැබ් රථ | 12 | - | - | 12 |
| 2. | මෝටර් රථ | 02 | - | - | 02 |
| 3. | මයික්‍රෝ කයිරන් ජීප් රථ | 01 | - | - | 01 |
| 4. | වෑන් | 01 | - | - | 01 |
| 5. | මුදල් නෝට්ටු ගණනය කිරීමේ යන්ත්‍ර | 01 | - | 01 | 02 |
| 6. | ඩුප්ලෝ යන්ත්‍ර | 01 | - | - | 01 |
| 7. | ඡායා පිටපත් යන්ත්‍ර | 30 | - | - | 28 |
| 8. | පරිගණක | 129 | - | 01 | 130 |
| 9. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 95 | - | 15 | 110 |
| 10. | ලැප්ටෝප් පරිගණක | 06 | - | 53 | 59 |
| 11. | ෆැක්ස් යන්ත්‍ර | 24 | - | - | 24 |
| 12. | සේප්පු | 07 | - | - | 07 |
| 13. | කැමරා | - | - | 02 | 02 |
| 14. | රූපවාහිනී යන්ත්‍ර | 07 | - | - | 07 |
| 15. | ශීතකරණ | 05 | - | - | 05 |
| 16. | ශබ්ද විකාශන යන්ත්‍ර | 01 | - | - | 01 |
| 17. | ටැබ්ලට් පරිගණක | - | - | 09 | 09 |

## 3.2 ඉඩම් අංශය

### 3.2.1 ඉඩම් පැවරීම් අංශය

3.4 වගුව මඟින් 2021.01.01 සිට 2021.12.31 දිනට ඉඩම් පැවරීම් අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.4 : 2021 වර්ෂයේ ඉඩම් පැවරීම් අංශයේ කාර්ය සාධනය

| අනු අංකය | ව්‍යාපෘති | වාර්ෂික ඉලක්කය | නිම කල සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | අනුමත කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීම. (ව්‍යාපෘති කමිටු වෙත ඉදිරිපත් කිරීම.) | 50 | 10 |
| 2. | නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම් හා බදුදීම්. (රන්බිම ඔප්පු ප්‍රදානය, ශාසනාභිවන්දනා, ඉඩම් ගැටලු විසඳීමේ ජංගම සේවාව) | 6000 | 4348 |
| 3. | බණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති හා ඉස්සන් වගාව ව්‍යාපෘති (වැලි, කළු ගල්, සිලිකා, මැණික්, ඩොලමයිට්) | 70 | 40 |

මීට අමතරව විවිධ රාජ්‍ය ආයතන වලට පොදු කටයුතු සඳහා ඉඩම් බදු දීම/විකිණීම් - 15

### 3.2.2 ඉඩම් උපරිම සීමා අංශය

3.5 වගුව මඟින් 2021.01.01 සිට 2021.12.31 දිනට ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.5 : 2021 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය

| අනු අංකය | විස්තරය | ඉලක්කය | නිම වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | 19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම. | 02 | 01 |
| 2. | 14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම. | 04 | - |
| 3. | 22 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම. | 09 | 05 |
| 4. | ප්‍රකාශක නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම. | 03 | - |

### 3.2.3 තක්සේරු හා වන්දි අංශය

3.6 වගුව මඟින් 2021.01.01 සිට 2021.12.31 දිනට තක්සේරු හා වන්දි අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 3.6: 2021 වර්ෂයේ තක්සේරු සහ වන්දි අංශයේ කාර්ය සාධනය වගුව

| අනු අංකය | විස්තරය | ප්‍රකාශයකින් ගණන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|
| 1. | වන්දි ගෙවීම් / පොලී ගෙවීම් | - | උසාවි තැන්පතු සඳහා ගැසට් කිරීම් 24 |
| 2. | ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු කැඳවා වාර්තා කැඳවීම්<br><br>01. ඉඩම් විකිණීම් / ඉඩම් බදු දීම් | 76 | - |
| 3. | ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු කැඳවා වාර්තා කිරීම. | 77 | රු. 43,374,320.00 |

## 3.3 නීති අංශය

3.7 වගුව මඟින් 2021.01.01 සිට 2021.12.31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

**වගුව 3.7: 2021 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත**

| අනු අංකය | විස්තරය | 2020.12.31 දිනට පවතින නඩු | 2021 වර්ෂය තුල නිම වූ සමතයට පත් වූ නඩු | 2021 වර්ෂය තුල පවරන ලද නඩු සංඛ්‍යාව | 2021.12.31 දිනට පවතින නඩු |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රේෂ්ඨාධිකරණය | 43 | 06 | 09 | 46 |
| 2. | අභියාචනාධිකරණය | 43 | 04 | 26 | 65 |
| 3. | මහාධිකරණය | 25 | 00 | 07 | 32 |
| 4. | දිසා අධිකරණය | 530 | 12 | 56 | 574 |
| 5. | මහේස්ත්‍රාත් අධිකරණය | 212 | - | 06 | 218 |
| 6. | කම්කරු විනිශ්චය සභාව | 04 | 03 | - | 01 |
| 7. | මානව හිමිකම් කොමිෂන් සභාව | 01 | - | 07 | 08 |
| 8. | සිවිල් අභියාචනා මහධිකරණය | 31 | 10 | 10 | 31 |
| | **එකතුව** | **889** | **35** | **121** | **975** |

## 3.4 මුදල් අංශය

### 3.4.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම

#### 3.4.1.1 ආයතනික තොරතුරු

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) පිහිටුවන ලදී.

ඕනෑම පුද්ගලයකු සතු කෘෂිකාර්මික ඉඩම් උපරිම සීමාවට වඩා වැඩි ප්‍රමාණයක් පවරා ගැනීම සහ එම ඉඩම එහි ඵලදායිතාව සහ එම ඉඩමෙන් උත්පාදනය වන රැකියා ඉහළ නැංවීමට හේතු වන අයුරින් ප්‍රයෝජනයට ගැනීම.

2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/3/02015 අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවරාජ්‍ය ව්‍යවසායන්හි "C" උප කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇත.

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවහි ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය**

කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ඉඩම් හිමියන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ ඔවුන්ට වන්දි ගෙවීම, ඵලදායී ආයෝජන සඳහා පවරා ඇති ඉඩම් පරිහරණය කිරීම සහ කොමිෂන් සභාවේ ආදායම් එකතු කිරීම, ඉඩම් ආරක්ෂා කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සුබසාධනය ය.

**2021** වසර අවසානයේ කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව **560** කි.

**නිකුත් කිරීම සඳහා අවසර දුන් දිනය**

**2021** වර්ෂය සඳහා **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවහි** මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව විසින් **2022** පෙබරවාරි **21** වන දින සහතික කරන ලදී.

**අඛණ්ඩව පැවැත්වීමේ පදනම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවහි මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අවධානයට ලක්වන පදනම මත ය.

**මූල්‍ය කාලය**

කොමිෂන් සභාවේ මූල්‍ය කාලසීමාව **2021** ජනවාරි **01** සිට **2021** දෙසැම්බර් **31** දක්වා මාස දොළහක කාලයක් නියෝජනය කරයි.

**මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

**අනුකූලතා ප්‍රකාශය**

**LRC** හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති **(SLPSAS) 1** සිට **20** දක්වා ප්‍රකාරව සකස් කර ඇත. **LRC** මූල්‍ය ප්‍රකාශන සමන්විත වන්නේ මූල්‍ය තත්ත්වය

ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ **SLPSAS -1** ට අනුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් සමඟිනි.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

**මිනුම් පදනම**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් සිදු කරන අවස්ථා හැරමූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

**සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු, සංසන්දනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා වත්මන් කාලපරිච්ඡේදයේ සහ ක්ෂණික සමත් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා පෙර කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් අනාවරණය කරනු ලැබේ.

අවශ්‍ය වූ විට, සංසන්දනාත්මක සංඛ්‍යා වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුරූප වන පරිදි නැවත සකස් කර ඇත.

**ද්‍රව්‍යමය හා එකතු කිරීම**

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ශ්‍රිතයක අයිතමයන් ද්‍රව්‍යමය නොවන ඒවා නම්, ඒවා වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

**ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්**

මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුළ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

### 3.4.1.2 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

**දේපල, පිරියත සහ උපකරණ**

**SLPSAS -07** අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කොමිෂන් සභාවේ දේපළ, පිරියත සහ උපකරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් **2019** ජනවාරි **01** දිනට **1972** අංක **01** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙත පවරා ඇති ඉඩම් හැර අනෙකුත් සියලුම ස්ථාවර වත්කම් නැවත තක්සේරු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන දේපල, පිරියත සහ උපකරණ වටිනාකම **2019** මිලදී ගැනීමට පෙර ප්‍රති තක්සේරු පදනමින් දක්වා ඇති අතර **2019** වසරේ සිට මේ දක්වා මිලදී ගත් වත්කම් මිලදී ගත් පිරිවැය පදනමින් දක්වා ඇත. මූල්‍ය තත්වයේ ප්‍රකාශයේ ප්‍රතිඅගය සංචිත ලෙස දක්වා ඇති ස්ථාවර

වත්කම් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අතිරික්තය හෝ හිඟය. ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ නියාමක ජනරාල් කාර්යාලය විසින් ලබා දී ඇති උපදෙස් සහ ගිල්ඩ්ලයින් අනුව උපලේඛන අංක **03** හි දේපල, පිරියත සහ උපකරණ කාණ්ඩ හතරක් වර්ගීකරණය කර ඇත.

**හඳුනාගැනීමේ සහ මැනීමේ පදනම**

කොමිෂන් සභාව වෙත වත්කම් ප්‍රවාහය හා විශ්වාසනීය ලෙස මැනිය හැකි වත්කම්වල වටිනාකම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ සම්භාවිතාවක් තිබේ නම්, දේපළ, කම්හල් සහ උපකරණ පිළිගනු ලැබේ. අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු කිරීමේ පිරිවැය දරන ලද විස්තීරණ ආදායමේ ප්‍රකාශයේ හඳුනාගෙන ඇත. දේපල, කම්හල සහ උපකරණවල රැගෙන යා හැකි වටිනාකම ආපසු හැරවිය නොහැකි බව සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට දුර්වලතා සඳහා සමාලෝචනය කෙරේ.

**ක්ෂය වීම**

**LRC** දේපල, කම්හල් සහ උපකරණ ක්ෂයවීම් ප්‍රතිපත්තිය **2018** වර්ෂයේ සිට ශේෂ ක්‍රමය අඩු කිරීමේ සිට සරල රේඛා ක්‍රමය දක්වා වෙනස් කර ඇති අතර පසුව කොමිෂන් සභාවේ දේපල, කම්හල් සහ උපකරණ නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙන් පසුව වෙනස් කර ඇත. නව ක්ෂයවීම් ප්‍රතිපත්තියට අනුව, අත්පත් කරගත් වත්කම් සහ ප්‍රති තක්සේරු වත්කම්, වත්කම් මිලදී ගත් හෝ ප්‍රති තක්සේරු කළ දිනයේ දී මුළු අත්පත් කර ගත් පිරිවැයෙන් රුපියලක අගයක් දක්වා ක්ෂය වෙමින් පවතී. වත්කම්වල ඉතිරි වටිනාකම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය භාවිතා කිරීමෙන් එකවර වෙන් කරයි.

කොමිෂන් සභාවේ දේපල, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ක්ෂයවීම් අනුපාත පහත දැක්වේ;

| <u>දේපළ වර්ගය</u> | <u>ක්ෂයවීම් අනුපාතය</u> |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| පරිගණක උපකරණ | 20% |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 10% |
| මෝටර් වාහන | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 20% |
| සුභසාධන උපකරණ | 20% |
| බයිසිකලය | 20% |

**හඳුනා නොගැනීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගන්නා ලදී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ රැගෙන යන මුදල අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර වත්කම් හඳුනා නොගත් වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇත.

**ආයෝජන දේපල**

**1972** අංක **01** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති ඉඩම **SLPSAS -13** යටතේ ආයෝජන දේපළ ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දක්වා ඇත. මක්නිසාද යත්, දිගුකාලීන බදු පදනම හරහා කොමිෂන් සභාවේ ආදායම් උත්පාදන ක්‍රියාවලිය සඳහා පවරා ඇති ඉඩම් භාවිතා කළ බැවිනි.

**තොග**

**SLPSAS -09** නිකුත් කරන ලද සහ පළමුව ඇතුලට පළමුව එළියට **(First in First Out (FIFO)** ක්‍රමයට අනුව අගය කරනු ලබන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ කොමිෂන් සභාවේ තොග සටහන් කර ඇත. වසර අවසානයේදී තොග නවතම මිලදී ගැනීමේ පිරිවැය/ තොගවල මිල සඳහන් වේ. කොමිෂන් සභාවේ තොගවලට විවිධ ආකාරයේ යෙදුම් ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වේ.

**මූල්‍ය වත්කම් - මූලික හඳුනා ගැනීම සහ මැනීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය **39** හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරෙන ආයෝජන හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. කොමිෂන් සභාව ණය සහ ලැබිය යුතු දේ සහ තැන්පතු ඒවා ආරම්භ වූ දිනයේම හඳුනා ගනී.

කොමිෂන් සභාවේ මූල්‍ය වත්කම්වලට ලැබිය යුතු මුදල්, ණය සහ කාර්ය මණ්ඩලයට අත්තිකාරම්, කල්පිරීමට තිබෙන මූල්‍ය වත්කම් සහ මුදල් හා මුදල්වලට සමාන දෑ ඇතුළත් වේ. ණය සහ ලැබිය යුතු ඒවා ආරම්භ වූ දිනයේ දී හඳුනා ගැනේ. ණය සහ ලැබිය යුතු මුදල් ඒවායේ පිරිවැය අනුව දක්වා ඇත. ණය සහ ලැබිය යුතු මුදල්, වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු මුදල් වලින් සමන්විත වේ.

**කල් පිරීමට තිබෙනවත්කම් (**HTM)

කාලීන තැන්පතු වලින් ලැබිය යුතු වන්දි ගෙවීම සහ පොලී සඳහා වන සංචිත සහ කෙටි කාලයක් සඳහා රජයේ බැංකුවේ ආයෝජනය කරන භාණ්ඩාගාර බිල්පත් **HTM** ආයෝජන යටතේ වර්ග කර ඇත.

**මුදල් සහ මුදල්වලට සමාන දෑ**

කොමිස් මුදල්, අතේ තිබූ චෙක්පත්, ගිණුම් තුනකින් සහ ඉතිරි කිරීමේ ගිණුම් දෙකකින් සමන්විත වූ අතර කොමිෂන් සභාවේ මුදල් කළමනාකාරිත්වයේ අත්‍යවශ්‍ය අංගයක් සහිත බැංකු ශේෂයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ කොටස්වල අංගයක් ලෙස ඇතුළත් කර ඇත. මුදල් සහ මුදල්වලට සමාන දෑ, අතේ ඇති මුදල්, බැංකුවේ මුදල්, බැංකුවේ තැන්පතු ඇතුළත් වේ.

**වගකීම් සහ ප්‍රතිපාදන**

වගකීමක් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට වත්මන් ලෙස වර්ග කර ඇත; මූලික වශයෙන් අද දින ක්‍රියාත්මක වන දිනය සඳහා පවත්වනු ලබන අතර, වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට හෝ වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහකට වගකීම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත. කොමිෂන් සභාව අනෙකුත් සියලුම වගකීම් වත්මන් නොවන ලෙස වර්ගීකරණය කළේය.

**අවිනිශ්චිත වගකීම්**

කොමිෂන් සභාව විසින් අනාගතයේදී කොමිෂන් සභාවට එරෙහිව අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග සමඟ ඇස්තමේන්තු කර ඇති අතර, කොමිසමට ඇස්තමේන්තුගත අවිනිශ්චිත වගකීම් රුපියල් මිලියන **750** ක් පමණ බාහිර පුද්ගලයින්ට ගෙවීමට සිදුවනු ඇත. අදාළ බලධාරීන්ගෙන් සහ පාර්ශ්වයන්ගෙන් අදාළ සියලුම ලිඛිත සාක්ෂි සහ තහවුරු කිරීම් ලැබුණු පසු මූල්‍ය ප්‍රකාශන මඟින් ප්‍රතිපාදන සලසනු ඇත.

**අවිනිශ්චිත වත්කම්**

කොමිෂන් සභාව විසින් ගනු ලැබූ අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග සමඟ කොමිෂන් සභාව ඇස්තමේන්තු කර ඇති අතර, ඉදිරියේදී කොමිසමට බාහිර පුද්ගලයන්ගෙන් රුපියල් මිලියන 1,242 ක ඇස්තමේන්තුගත මුදලක් ලැබෙනු ඇත. එසේම, කොමිස් ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ කටයුතු හේතුවෙන් කොමිසමට පිටස්තර පුද්ගලයින්ගෙන් රුපියල් මිලියන 249 ක් ලැබෙනු ඇත.

**ප්‍රතිපාදන**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට නෛතික හෝ ව්‍යවස්ථාපිත බැඳීමක් ඇති විට, වගකීම පියවීමට වත්කම් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීම විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

**සේවක ප්‍රතිලාභ**

**සේවක අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිතය**

කොමිෂන් සභාවේ පශ්චාත් රැකියා ප්‍රතිලාභ (පාරිතෝෂිකය) SLPSAS -19 හි දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතයෙන් ගණනය කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් විශේෂිත එක්සෙල් ආකෘතිය ලබා දී ඇත. SLPSAS -19 අනුව කොමිෂන් සභාවේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයකුට ඔහුගේ/ඇයගේ මූලික වැටුප සහ මසකට ජීවන වියදම් දීමනාව අවසන් වරට ලබා ගැනීමේදී පාරිතෝෂික ප්‍රතිපාදන සලසා ඇත. කොමිෂන් සභාවේ මෙම ප්‍රතිපත්තිය මත සිදු කරනු ලබන වාර්ෂික පාරිතෝෂික ප්‍රතිපාදන වලදී.

**නිර්වචනය කළ දායක සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල**

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවක භාර අරමුදල් දායක මුදල් සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. මේවා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත. "සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක" භාරකාර අරමුදලට පිළිවෙළින් සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව සමඟින් මූලික මුදලින් 15%ක් සහ 3%ක් කොමිෂන් සභාව දායක වේ.

**බදුකරණය**

**ආදායම් බදු**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) (ii) වගන්තිය යටතේ කෙටි කාලීන තැන්පතු සහ අරමුදල් කළමනාකරණයෙන් උපයන පොලිය හැර කොමිස් මුදලේ අතිරික්තය සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කෙරේ.

**වෙනත් බදු**

VAT, NBT **සහ** WHT **බදු ඉඩම්** කුලියට සහ කොමිෂන් සභාවට ලැබෙන අනෙකුත් සේවා ගාස්තු සඳහා ගෙවනු ලැබේ. එබැවින් වෙනත් බදු සඳහා ප්‍රතිපාදන සලසා නැත.

**කල් දැමූ බදුකරණය**

**2006** අංක **10** දරන දේශීය ආදායම් පනතේ **7 (ආ),(ii)** වගන්තිය යටතේ කොමිෂන් සභාවේ අතිරික්තය සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බැවින් කල් දැමූ බද්දක් සඳහා ප්‍රතිපාදන සලසා නැත.

**රජයේ ප්‍රදාන**

මුලදී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීමේ අදියර සඳහා රජයේ දායකත්වයක් ලෙස ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට රුපියල් **15,000,000/-** ලබා දුන් අතර පසුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු දැරීමට මහා භාණ්ඩාගාරය විසින් රුපියල් **1,949,075,000/-** ප්‍රදානය කර ඇත. ඉහත භාණ්ඩාගාර දායක මුදල් දෙකක් හැර, කොමිෂන් සභාවම භාවිතා කර පවත්වාගෙන යන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවරජයේ අරමුදල් නොගෙන අරමුදල් ජනනය කළේය. **2021** වසර තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව **2021** ජූලි **16** සහ **2021** දෙසැම්බර් යන දිනවල මහා භාණ්ඩාගාරයට ඍජු ප්‍රේෂණ ලෙස රුපියල් **350,000,000** ක් සහ රුපියල් **750,000,000** ක් සිදු කරන ලදී.

## 3.4.1 අවසන් ගිණුම් වාර්තා

**වගුව 3.8 : 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම ප්‍රකාශය**

| විස්තරය | සටහන් | 31.12.2021 රු. | 31.12.2020 රු. |
|---|---|---|---|
| ආදායම | 14 | 445,038,619.25 | 453,242,112.37 |
| අවනත් මෙහෙයුම් ආදායම් | 15 | 163,586,773.18 | 93,451,176.39 |
| පරිපාලන වියදම් | 16 | (513,487,668.86) | (398,902,668.03) |
| ක්ෂයයුම් සහ අවශ්‍ය වියදම් | 17 | (26,894,095.02) | (11,339,514.68) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 18 | (33,875,670.83) | (18,532,978.72) |
| මෙහෙයුම් අතිරික්තය | | **34,367,957.72** | **117,918,127.33** |
| මූල්‍ය ආදායම් | 19 | 117,588,493.27 | 167,584,554.14 |
| මූල්‍ය වියදම් | 20 | (217,886.91) | (266,380.94) |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | | **151,738,564.08** | **285,236,300.53** |
| 2021.01.01 දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය | | 1,698,730,729.77 | 1,288,398,311.77 |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 21 | 239,979,798.22 | (9,279,968.55) |
| පාරිතෝෂික (අතිරික්ත ප්‍රතිපාදන) | | - | 187,905,904.47 |
| වෙනත් ගණුදෙනු (බදු කුළිය හා අධිභාර ලියා හැරීම) | 22 | - | (53,529,818.45) |
| 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ අදායම | | **2,090,449,092.07** | **1,698,730,729.77** |

.....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

එස්. පී. එස්. සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

.....

නීතිඥ නිලන්ත විජේසිංහ
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

නීතිඥ නිලන්ත විජේසිංහ (ආරක්ෂකේ)
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල

.....

ඩබ්ලිව්.ඒ.චූලානන්ද පෙරේරා
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

## වගුව 3.9 : 2021.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | සටහන් | 2021.12.31<br>රු. | 2020.12.31<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | 3 | 102,346,547.79 | 98,233,545.37 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **102,346,547.79** | **98,233,545.37** |
| ආයෝජන වත්කම් | | | |
| 1972 අංක 01 දරණ පනත යටතේ පවරන ලද ඉඩම් | | **676,169,345.33** | **676,169,345.33** |
| ජංගමවත්කම් | | | |
| තොග - ලිපි ද්‍රව්‍ය | 4 | 3,496,750.30 | 2,773,135.72 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 5 | 2,979,483,250.41 | 2,600,956,706.15 |
| ලැබිය යුතු පොලී | 6 | 28,803,687.36 | 59,793,839.17 |
| තැන්පතු හා අත්තිකාරම් | 7 | 88,413,622.47 | 87,760,888.75 |
| කෙටිකාලීන බැංකු තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් | 8 | 1,334,716,556.69 | 2,157,818,643.98 |
| මුදල්, මුදල් හා සමාන දෑ | 9 | 56,312,541.03 | 60,448,752.08 |
| **මුළු ජංගම වත්කම්** | | **4,491,226,408.26** | **4,969,551,965.85** |
| **මුළු වත්කම්** | | **5,269,742,301.38** | **5,743,954,856.55** |
| අරමුදල් හා වගකීම් | | | |
| සමුච්චිත අරමුදල් හා සංචිත | | | |
| සංචිත | 10 | 1,739,372,755.01 | 1,580,826,465.28 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | | 57,286,312.88 | 56,667,562.88 |
| ස්ථාවර වත්කම් පරිත්‍යාග සංචිත | | 1,032,667.20 | 1,210,637.66 |
| සමුච්චිත අතිරික්තය | | 2,090,449,092.07 | 1,698,730,729.77 |
| **මුළු සමුච්චිත අරමුදල් හා සංචිත** | | **3,888,140,827.16** | **3,337,435,395.59** |
| අරමුදල් සහ ප්‍රධාන | | | |
| රජයේ දායකත්වය හා භාණ්ඩාගාර ප්‍රධාන | 11 | 864,075,000.00 | 1,964,075,000.00 |
| **මුළු අරමුදල් සහ ප්‍රධාන** | | **864,075,000.00** | **1,964,075,000.00** |
| ජංගම නොවන වගකීම් | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 12 | 147,668,229.58 | 95,454,406.71 |
| වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර I | | 105,955,026.51 | 105,955,026.50 |
| වන්දි අවිනිශ්චිත ගිණුම - අදියර II | | 109,959,492.95 | 109,959,492.95 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **363,582,749.04** | **311,368,926.16** |
| ජංගමවගකීම් | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 13 | 151,743,310.79 | 130,186,651.11 |
| ගෙවිය යුතු එකතුකල අගය මත බදු | | 2,200,414.38 | 888,883.67 |
| **මුළු ජංගම වගකීම්** | | **153,943,725.17** | **131,075,534.78** |
| **මුළු වගකීම්** | | **517,526,474.21** | **442,444,460.94** |
| **මුළු වගකීම් හා සංචිත** | | **5,269,742,301.38** | **5,743,954,856.55** |

| වගුව 3.10 : 2021.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | | |
|---|---|---|---|
| විස්තරය | සටහන් | 31.12.2021<br>රු. | 31.12.2020<br>රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය | | **151,738,564.08** | **285,236,300.53** |
| ගැළපීම් | | | |
| ක්ෂය | | 16,612,319.67 | 14,410,437.77 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 54,666,970.68 | 95,454,406.71 |
| ආයෝජන ආදායම | | (116,404,154.35) | - |
| මූල්‍ය ආදායම | | (1,184,338.92) | (167,584,554.14) |
| මූල්‍ය වියදම් | | 217,886.91 | 266,380.94 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම (ලාභ හෝ පාඩු) | | 6,612.67 | 26,583.59 |
| අස්ථානගත වූ ස්ථාවර වත්කම් සඳහා අයකරගැනීම් (ලාභ හෝ පාඩු) | | (15,516.43) | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | | 241,055,025.93 | - |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **346,693,370.24** | **227,809,555.40** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| වෙලඳභා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම් හෝ වැඩිවීම් | | 22,868,190.39 | (11,399,775.99) |
| තොග වල අඩුවීම් හෝ වැඩිවීම් | | (723,614.58) | 1,466,566.22 |
| වෙලඳ සහ වෙනත් ලැබිය යුතු දෑ අඩුවීම් හෝ වැඩිවීම් | | (378,526,544.26) | (142,701,448.98) |
| ලැබිය යුතු පොළී ආදායම අඩුවීම් හෝ වැඩිවීම් | | 30,990,151.81 | 37,194,054.74 |
| තැන්පතු හා අත්තිකාරම් අඩුවීම් හෝ වැඩිවීම් | | (652,733.72) | (2,838,729.16) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය කරන මුදල් ප්‍රවාහය** | | **20,648,819.88** | **109,530,222.24** |
| පාරිතෝෂික ගෙවීම් | | (3,586,102.50) | (5,973,920.00) |
| වන්දි ගෙවීම් | | - | 673,010.90 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **17,062,717.38** | **104,229,313.14** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (20,277,569.72) | (5,592,817.56) |
| ස්ථාවර තැන්පතු ආපසු ගැනීම් | | - | - |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රතිමිලදි ගැනුම් තැන්පතු ආයෝජන | | (709,898,023.50) | (238,950,875.01) |
| ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රතිමිලදි ගැනුම් තැන්පතු වසා දැමීම් | | 1,533,000,110.79 | - |
| ආයෝජන ආදායම | | 116,437,979.35 | 201,216,399.71 |
| භාණ්ඩාගාරයට මුදල් ප්‍රේශණය කිරීම | | (1,100,000,000.00) | - |
| කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | | 350,000,000.00 | - |
| ඉඩම් අමාත්‍යාංශය මඟින් උතුරු මැද පළාතේ කාබනික පොහොර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ලංකා බැංකු ගිණුමක් විවෘත කර එයට මාරු කිරීම | | (350,000,000.00) | - |
| අස්ථානගත වූ ස්ථාවර වත්කම් වලට අදාළ වටිනාකම් අයකර ගැනීමෙන් ලද මුදල් | | 10,422.41 | - |
| අබලි ද්‍රව්‍ය වෙන්දේසියේ විකිණීමෙන් ලද මුදල් | | 15,410.50 | (26,583.59) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(180,711,670.17)** | **(43,353,876.45)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය** | | - | - |
| ඉඩම් විකුණුම් ශුද්ධ වටිනාකම් | | - | 120,131,999.89 |
| මූල්‍ය ආදායම් ලැබීම් | | 1,184,338.92 | - |
| මූල්‍ය වියදම් | | (217,886.91) | (266,380.94) |
| 40% සංචිතය | | 158,546,289.73 | - |
| පෙර වර්ෂයේ ගැලපුම් | | - | (180,741,055.64) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **159,512,741.74** | **(60,875,436.69)** |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස්වීම්** | | **(4,136,211.05)** | **(1,522,958.65)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **60,448,752.08** | **61,971,710.73** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ වටිනාකම්** | | **56,312,541.03** | **60,448,752.08** |

වගුව 3.11 : 2021.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | රජයේදායකත්වය රු. | භාණ්ඩාගාර ප්‍රධාන රු. | ප්‍රාග්ධන සංචිත රු. | සමුච්චිත අතිරික්තය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2020.01.01 දිනට ආරම්භක ශේෂය** | **15,000,000.00** | **1,949,075,000.00** | **1,517,761,028.26** | **1,288,398,311.77** | **4,770,234,340.03** |
| වර්ෂය සඳහා අතිරික්තය | - | - | - | 419,612,386.55 | 419,612,386.55 |
| ඉඩම් විකුණුම් ශුද්ධ වටිනාකම (40%) | | | 120,131,999.89 | | 120,131,999.89 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය | | | 811,637.67 | | 811,637.67 |
| පෙරවර්ෂය සඳහා ගැලපීම් | | | | (9,279,968.55) | (9,279,968.55) |
| **2020.12.31 දිනට ශේෂය** | **15,000,000.00** | **1,949,075,000.00** | **1,638,704,665.82** | **1,698,730,729.77** | **5,301,510,395.59** |
| වර්ෂය සඳහා අතිරික්තය | | | | 151,738,564.08 | 151,738,564.08 |
| **මුළු විස්තීරණ ආදායම්** | | | | | |
| ඉඩම් විකුණුම් ශුද්ධ වටිනාකම (40%) | | | 158,546,289.73 | | 158,546,289.73 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය | | | 440,779.54 | | 440,779.54 |
| මහා භාණ්ඩාගාරයට මුදල් යැවීම | | (1,100,000,000.00) | | | (1,100,000,000.00) |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | | | | 239,979,798.22 | 239,979,798.22 |
| **2021.12.31 දිනට ශේෂය** | **15,000,000.00** | **849,075,000.00** | **1,797,691,735.09** | **2,090,449,092.07** | **4,752,215,827.16** |

## 3.5 අභ්‍යන්තර විගණන අංශය

### 3.5.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත හා 1971 අංක 38 දරන මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 02 වන වගන්තියේ අනු වගන්ති 01 – 03 අනුව විගණන සඳහා බලය ලැබී ඇත.

### 3.5.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

I. යොමු කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් - 32
II. පරීක්ෂා කර ආදායම් අංශයට ලබා දී ඇති ගොනු ගණන - 156
III. විගණනය කරන ලද දිස්ත්‍රික් කාර්යාල - 07
IV. පවත්වන ලද ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 03
V. පරිතෝෂික ගෙවීම් සම්බන්ධ පරීක්ෂණ - 06
VI. විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම - විමසුම් 10
VII. වන්දි හා පොළි ගෙවීම් පරීක්ෂා - ගොනු 12
VIII. කාබනික පොහොර ව්‍යාපෘතියට අදාලව විගණන පරීක්ෂා - 03
IX. ප්‍රසාද දීමනා සම්බන්ධ වවුචර් පත්, වැටුප් රහිත නිවාඩු ගැලපීම් කර විගණනය කිරීම.
X. සියළුම නව පත්වීම් වලට අදාල වැටුප් පරීක්ෂා කිරීම.
XI. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමට අවශ්‍ය තොරතුරු ලබාදීම.
XII. 2021 අමාත්‍යාංශීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 3.6 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය

සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් පැතිරි පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

- දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ කටයුතු.
- අමාත්‍යාංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ඡා හා සම්මන්ත්‍රණ වලට සහභාගී වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගී වීම.
- කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම.
- රජයේ අවශ්‍යතාවය සඳහා ආයතන වලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- දිස්ත්‍රික් ඉඩම් ලේඛණ සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාල රාජකාරි කටයුතු.
- දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛණය, බැහැර කළ ඉඩම් ලේඛණය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සාකච්ඡා කර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.

- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු ප්‍රධාන කාර්යාලයේ තොරතුරු නිලධාරි වෙත නියමිත කාලයේ දී ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබාදීමේ උත්සව සංවිධානය කිරීම.
- පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබා දීමට අදාල කටයුතු.
- රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධිකරණය හා පසු විපරම් කටයුතු.
- විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධිකරණ කටයුතු කිරීම.
- බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනුම්දෝරුවන්ට සහය වීම.

දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල කාර්යාල පිහිටුවා ඇති දිස්ත්‍රික්ක සහ ලිපිනයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. බස්නාහිර පළාත | කොළඹ | සෙන්ටර් ෆෝමසි ගොඩනැගිල්ල, පාදුක්ක |
| | කළුතර | අංක 184/ඒ, පන්සල පාර, කළුතර |
| | ගම්පහ | ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල, කව්වේරිය, ගම්පහ |
| 2. දකුණු පළාත | ගාල්ල | අංක 27, රිව්මන්ඩ් කන්ද පාර, කළුවැල්ල, ගාල්ල |
| | මාතර | අංක 17/ඒ, ධර්මරත්න පාර, උයන්වත්ත, මාතර |
| | තංගල්ල | උසාවිය පාර, තංගල්ල |
| 3. ඌව පළාත | මොණරාගල | ජනසවි ගොඩනැගිල්ල, කව්වේරි හන්දිය, මොණරාගල |
| | බදුල්ල | අංක 195, කැප්පෙටිපොළ පාර, බදුල්ල |
| 4. නැගෙනහිර පළාත | අම්පාර | කව්වේරිය, අම්පාර |
| | මඩකලපුව | කව්වේරිය, මඩකලපුව |
| 5. උතුරු පළාත | යාපනය | කව්වේරිය, යාපනය |
| 6. උතුරු මැද පළාත | අනුරාධපුර | අංක 388/17, වැව පාර, නව නගරය, අනුරාධපුරය |
| 7. සබරගමුව පළාත | රත්නපුර | ෆෑම් ගාඩ්න් වත්ත, නව නගරය, රත්නපුර |
| | ඇඹිලිපිටිය | 12 බී, තොග ගබඩාව පාර, නව නගරය,ඇඹිලිපිටිය |
| | කෑගල්ල | කව්වේරිය, කෑගල්ල |
| 8. වයඹ පළාත | පුත්තලම | පම්බල, කාකපල්ලිය, මාදම්පේ |
| | කුරුණෑගල | අංක 16, උතුරු වැව පාර, කුරුණෑගල |
| 9. මධ්‍යම පළාත | නුවරඑළිය | I.R.D.Pගොඩනැගිල්ල,උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය |
| | මහනුවර | සිව්වන මහල,නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| | මාතලේ | කව්වේරිය, මාතලේ |

# ඇමුණුම්

**A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය
எனது இல.
My No. PAL/A/LRC/1/2021/21

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி 2022 නොවැම්බර් 30 දිනයි


ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
06 DEC 2022
සභාපති අංශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
08 OCT 2022


සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 01 හි 48 ඡේදය ප්‍රකාර ප්‍රමිති මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවත්, වර්ෂය තුළ දරන ලද නීති ගාස්තු වියදම් වූ රු.24,137,438 ට එරෙහිව කොමිෂන් සභාව සතු ඉඩම් විකිණීමෙදී ගැනුම්කරුගෙන් අයකර ගත් රු.2,717,462 ක මුදලක් හිලව් කර තිබුණි.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 01 හි 99 ඡේදය මඟින් පෙන්වා දී ඇති පරිදි, වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් හැර කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියලු ආදායම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායමෙන් සියයට 40 ක් වූ රු.158,546,289 ක වටිනාකම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් නොකර සෘජුවම ප්‍රාග්ධන සංචිතයට බැර කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 02 හි 9 ඡේදය අනුව මාස 3 හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන කෙටිකාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.1,334,716,557 ක් වූ කෙටිකාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වටිනාකමහි ඇතුළත් මාස තුන හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන රු.209,963,420 ක කෙටිකාලීන ආයෝජන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති මුදල් හා මුදල් සමාන දෑ ශේෂය තුළ ඇතුළත්ව නොතිබීම හේතුවෙන්, බැංකු කෙටිකාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන වටිනාකම එම අගයෙන් වැඩියෙන් ද, මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති 08 හි 100 හා 105 ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් හා වත්කම් පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඇස්තමේන්තුකර ගිණුම් ප්‍රතිපත්තිවල දක්වා ඇති රු.මිලියන 750 ක අසම්භාව්‍ය බැරකම් සහ රු.බිලියන 1491 ක අසම්භාව්‍ය වත්කම් සම්බන්ධව එසේ කටයුතුකර නොතිබුණි.

(ඉ) 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම්වලට අදාළ, ඉඩම් අක්කර ගණන, එක් එක් ඉඩම් පිහිටි ප්‍රදේශ, අත්පත් කරගනු ලැබුවේ කවරෙකුගෙන්ද, දැනට බුක්තිය පවරාදීම් පිළිබඳ විස්තර හා අදාළ ගැසට් නිවේදන සහ ඉඩම් බැහැරකිරීම්වලට අදාළ සියලුම විස්තර පිළිබඳ වූ සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලේඛනයක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණු අතර, ඒ පිළිබඳ උපයෝගී ලියවිලි මඟින් පැහැදිලි කිරීමටද ආයතනය අපොහොසත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.676,169,345 ක් වූ පවරාගත් ඉඩම්වල පැවැත්ම හා අගය කිරීමේ නිවැරදිකාවය පිළිබඳව විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය.

(ඊ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව, වතු සමාගම්වලින් සහ පුද්ගලයන්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි අවිනිශ්චිත (අධියර - I සහ II) ගිණුමෙහි පැවති එකතුව රු.215,914,519 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන්වන

විට නිරවුල් කර නොතිබුණු අතර, වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ගිණුම් සටහන් මගින්ද හෙළිදරව් කර නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කරන බව අංක 1.6.2 දරන ගිණුම් ප්‍රතිපත්තියෙහි සඳහන් කර තිබුණ ද, ආයෝජන ආදායම්, ඉඩම් බදු කුලී, ඒ මත අයකරන අධිභාර සහ කලුගල් බදු ආදායම් හැර ඉඩම් අත්පත් වන්දි, ඉඩම් පරිහරණ ගාස්තු, ඉඩම් විකුණුම් අදායම්, ගස් විකුණුම් ආදායම්, පස් විකුණුම් ආදායම් වැනි අනෙකුත් ආදායම් වර්ග 19 ක් යටතේ එකතු කරගත් එකතුව රු.440,135,525 ක ආදායමක් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ඌ) කොමිෂන් සභාවේ ආදායම් අංශය මගින් පවත්වාගෙන යනු ලබන ඉඩම් බදු කුලී ලේඛනයේ ඇතුළත් ආයතන 9 ක් සහ පුද්ගලයින් 03 කට අදාළ රු.13,307,625 ක බදු කුලී ආදායමක් ගිණුම් මගින් මගහැරී තිබුණි.

(එ) කලුගල් බදු ගැණුම්කරුවන් 19 ක ගෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ලැබිය යුතුව පැවති රු.61,957,870 ක හිඟ බදු මුදලින් සමාලෝචිත වර්ෂයේදී ලද බදු මුදල රු.3,735,200 ක් වූ අතර හිඟ බදු ලියා හැරීමක් සිදුකර නොමැති හෙයින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබිය යුතු කලුගල් බදු ආදායම රු.58,222,670 ක් විය යුතු වුවත්, එය සදොස්ව රු.13,237,050 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් ලැබිය යුතු කලුගල් බදු ආදායම රු.44,985,620 ක් අඩුවී තිබුණද එයට හේතු දක්වා නොතිබුණි.

(ඒ) කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට පෙර බදු දී තිබුණු එහෙත් ගිණුම් මගින් වාර්තා නොකළ කලුගල් බදුකරුවන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.136,773,278 ක මුදලක් වර්ෂයේ ආදායමට ඇතුළත් විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ ආදායම ලෙස රු.116,694,834 ක් මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා තිබීම හේතුවෙන්, කලුගල් බදු ආදායම රු.20,078,444 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ඔ) ඉඩම් බදුකරුවන් 12 දෙනකුගෙන් අයවිය යුතු රු.101,255,194 ක හිඟ බදු ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

(ඕ) ඉඩම් බදුකරුවන් 09 දෙනෙකුට අදාළව කොමිෂන් සභාවේ ආදායම් අංශය මගින් පවත්වාගෙන යනු ලබන ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉදිරිපත්කර ඇති මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් අතර රු.2,827,941 ක වෙනසක් පැවතුණි.

(ක) කළුතර දිස්ත්‍රික්කයේ අමරිතා ඇපරල් (පෞද්ගලික) සමාගම වෙතින් ලැබිය යුතු ලෙස පෙර වර්ෂවලදී හඳුනා නොගත් රු.1,851,852 ක ඉඩම් කල්බදු මුදලක්, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු අතර, එය පෙර වර්ෂ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂය වර්ෂයේ

ආදායමක් ලෙස සටහන් කිරීම හේතුවෙන්, එම අගයෙන් ඉඩම් බදු ආදායම වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඛ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.2,886,619,681 ක් වටිනා ලැබිය යුතු කළුගල් බදු, ඉඩම් බදු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සහ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂවල නිවැරදිභාවය තහවුරු කිරීම සඳහා ලෙජර් ගිණුම්, ශේෂ සනාතන ලිපි යනාදි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල චාරිතාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සභාව තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ 1.2(ඉ), (ඊ), (ඔ) යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

| | | |
|---|---|---|
| | (i) මු.රෙ.371 (5) | තත්ත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්ය නිමකර දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද, අවස්ථා 19 ක දී දෙන ලද රු.709,275 ක් වටිනා අතුරු අග්‍රිම පියවීමට දින 55 සිට දින 263 ක් දක්වා කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. |
| | (ii) මු.රෙ.751 | සියලුම භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් ලේඛන ගත කළ යුතු වුව ද, කොමිෂන් සභාව සඳහා දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීමට අදාළව රු.245,700 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු, ඩිජිටල් දුරකථන 05 ක් හා සාමාන්‍ය දුරකථන 40 ක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අතර, මෙම උපකරණ භාවිතාකරන හෝ භාරයේ පවතින නිලධාරීන්ගේ නාමලේඛනයක් ගොනු ගත කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (ඉඩම්) සහ අධ්‍යක්ෂ (පාලන හා ලේකම්) යන තනතුරු තුන සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර මාස 05 සිට මාස 12 අතර කාලයක් ගතවී තිබුණද, ස්ථීර පදනම මත අදාළ තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.2.2 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | ආයතනයේ අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට පෙර අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කළ රු.2,060,662,047 ක ආයෝජන සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි (ආ) වගන්තිය | චක්‍රලේඛය ප්‍රකාරව තනතුරු අලුතින් ඇතිකිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ නොමැතිව සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංචාරක බංගලා භාරකරු යන තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. |

(ඉ) 2021 නොවැම්බර් 17 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ

පවරාගත් ඉඩම් පිළිබඳ පිළිගත හැකි ලේඛනයක් සකස්කිරීම, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව 2018 වර්ෂයේදී බදවාගනු ලැබූ අතිරේක කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා ඒ අනුව ඉදිරි කටයුතු කිරීම, 2002-2004 කාලයේදී විධිමත් අනුමැතියකින් තොරව පවරාදුන් ඉඩම් පිළිබඳව ඉදිරි කටයුතු කිරීම, කොමිෂන් සභාව සතු ඉඩම් අගය කිරීම සඳහා කටයුතු කිරීම, විගණන වාර්තා මගින් අනාවරණය කර තිබුණු ගැටලු නිරාකරණය කර මාස 06 ක් ඇතුළත වාර්තා කිරීම සිදු කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.2,987,753,606 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙහි ඇතුළත් රාජ්‍ය ආයතන 07 කින් ලැබිය යුතු වර්ෂ 30 ඉක්ම වූ රු.2,127,271,837 ක් සහ වර්ෂ 10 ඉක්ම වූ රු.8,354,409 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 22 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද, අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,815 ක අත්තිකාරම් මුදල් වර්ෂ 16 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,392,992 ක් වූ ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂයෙහි වර්ෂ 10 කට වැඩි කාලයක සිට පවත්වාගෙන එන එකතුව

රු.10,377,992 ක ශේෂ ඇතුළත්ව තිබුණු මුත් ඒවා නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඉ) බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ග්ලේන් ඇල්පින් වත්ත නැමැති ඉඩමෙන් අක්කර 04 රූඩ් 02 ක ප්‍රමාණයක් 1978 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වර්ෂ 31 ක් ශ්‍රී කාලි අම්මාන් කෝවිල විසින් අනවසරයෙන් භුක්තිවිඳ ඇති බැවින් 2009 වර්ෂයේදී පරිපාලන ගාස්තු අයකිරීමට තීරණය කළ බව කෝවිලේ පරිපාලනය වෙත සභාව විසින් දැනුම් දී තිබුණද, අදාළ ගාස්තු ගණනය කර කෝවිල වෙත දැනුම් දීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. තවද, 2009 වර්ෂයේදී දේවාල පරිශ්‍රය පිහිටි අක්කර 2 ක කොටසක් විකිණීමෙන් පවරා දීමටත් තවත් අක්කර 4.2 ක ප්‍රමාණය බදු පදනමට ලබා දීමටත් කටයුතුකර තිබුණු අතර, ඊට අදාළව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයවිය යුතු රු.6,043,499 ක ඉඩම් බදු මුදල අයකර ගැනීමට සභාව කටයුතුකර නොතිබුණි.

(ඊ) කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කොටගලවත්ත නැමැති ඉඩමෙන් අක්කර 75 ක් වලංගු ගිවිසුමක් නොමැතිව, ප්‍රීතිපුර ළමා නිවාසය සඳහා වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබුණු අතර, අදාළ බදු කාලය 2009 වර්ෂයේදී අවසන් වී තිබුණද, 2009 වර්ෂයේ සිට වලංගු ගිවිසුමකට එළඹීමකින් තොරව අදාළ ඉඩම පරිහරණය කිරීමට කොමිෂන් සභාව අවස්ථාව ලබා දී තිබුණි. තවද, එම බදුකරුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට හිඟව පැවති රු.15,272,260 ක බදු මුදල අයකර ගැනීමට කටයුතු නොකර ලැබිය යුතු හිඟ බදු ආදායම රු.6,581,479 දක්වා අඩුකර තිබුණි.

(උ) ගාල්ල දිස්ත්‍රික්කයේ මහහේන්තැන්න වත්ත ඉඩමේ අක්කර 10 ක ප්‍රමාණයක් එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය යටතේ නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා "ඇල්පිටිය ඉහළ ප්‍රදේශයේ ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සමාජ සුභසාධන සමිතිය" වෙත ලබාදීමට අමතරව, ගිවිසුමක් මගින් අදාළ ඉඩමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.1,000,000 ක අත්තිකාරම් මුදලක් සියයට 10 ක වාර්ෂික පොලියට මාස 6 ක් තුළ ආපසු ගෙවීමේ පදනම මත 2019 වර්ෂයේදී ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර, අත්තිකාරම් මුදල සහ පොලිය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඌ) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි කිරිමුවට්ටවත්ත නැමැති ඉඩමෙන් අක්කර 04 ක් පුද්ගලික සමාගමක් වෙත වර්ෂ 30 ක කාලයක් සඳහා 2011 වර්ෂයේදී බදු දී තිබුණු අතර, ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේ දුෂ්කරතා හේතුවෙන් ඉඩම නැවත භුක්තිය පවරා ගන්නා ලෙස සමාගම විසින් 2016 වර්ෂයේ අවස්ථා 02 කදී ලිපි මඟින් සභාව දැනුවත්කර තිබුණ ද, අදාළ ඉඩම කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට හෝ රු.2,139,879 ක හිඟ මුදල අයකරගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි.

(එ) මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි අකුරම්බඩ වත්ත නැමැති ඉඩමට අයත් අංක 2011/133 දරන පිඹුරේ කැබලි අංක 01 න් දැක්වෙන අක්කර 02 රූඩ් 03 පර්චස් 37.13 ක් වූ ඉඩම පල්ලේපොල ප්‍රාදේශීය සභාව වෙත ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට 30 ක කාලයක් සඳහා බදු පදනමට ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,242,000 හිඟ බදු මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි.

(ඒ) කළුතර දිස්ත්‍රික්කයේ කාලවිලවත්ත ඉඩමෙන් රූඩ් 02 පර්චස් 9.94 ක බිම් ප්‍රමාණය සංචාරක නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා 2001 සැප්තැම්බර් 19 දින අංක 8502 දරන බදු ගිවිසුම මඟින් සඳළු ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම වෙත බදු දී තිබුණු අතර, බදු ගිවිසුම අනුව බදුකරු විසින් සෑම වර්ෂයකම ජූලි 11 හෝ ඊට පෙර බදුකුලිය ගෙවිය යුතු වුවද, අදාළ සමාගම විසින් 2002 වර්ෂයේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. ඒ අනුව බදුකරු විසින් බදු ගිවිසුමේ කොන්දේසි කඩකර ඇති විටකදී, ඒ බව මාස 06 කට පෙර ලිඛිතව බදුකරු වෙත දැනුම් දී බදු ගිවිසුම අවලංගු කිරීමට සහ සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු.27,945,900 ක හිඟ බදු අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි.

(ඔ) කොමිෂන් සභාව සඳහා, පූර්ණ ඒකාබද්ධ පරිගණක පද්ධතියක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වර්ෂයේ දී පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.17,000,000 ක මුදල නැවත ලබා ගැනීමට හෝ අදාළ පරිගණක පද්ධතිය ස්ථාපිත කරගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව කටයුතුකර නොතිබුණි.

(ඕ) සභාවේ ඉඩම් මැනුම් කර නියමානුකූල කරන අවස්ථාවේ කට්ටි කරුවන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට යටත්ව ඉඩම් මැනුම් කර බලයලත් මිනින්දෝරුවන් හට 2019,2020 හා 2021 යන වර්ෂ වලදී ගෙවා තිබුණු එකතුව රු.33,229,487 ක මුදලින් එම ඉඩම් කට්ටිකරුවන්ට පවරාදී නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,140,337 ක් පමණක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ක) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ප්‍රකාරව රාජ්‍ය සේවයේ තනතුරක් දරන යම් නිලධාරියෙක් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක සේවය භාරගැනීම සඳහා තමා දරන තනතුරෙන් මුදවා ගත යුතු වුවද, එසේ නොමැතිව නීතිඥ පී.ඒ.හසිත කුමාර මහතා 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම් මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථීර පදනම මත සේවයට බැඳී තිබුණි. එකම කාලය තුළ ආයතන 02 න් ලබාගෙන තිබුණු වැටුප් හා දීමනා

වටිනාකම රු.4,347,460 ක් වී තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණිම සහ කාර්ය සාධනය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ඛ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් 2019 මැයි 22 දින රු.8,500,000 කට මිලදී ගෙන තිබුණ ද, එම තොරතුරු පද්ධතිය මගින් ලැබිය යුතු ඉඩම් බදු මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ග) රැස්වීම් පැවැත්වීම සඳහා යොදාගත හැකි (ZOOM වැනි) මෘදුකාංග අන්තර්ජාලය මගින් නොමිලේ බාගතකර ගැනීමට හැකියාව තිබියදී, එසේ නොකර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් 21 දින රු.1,160,000 ක් ගෙවා රැස්වීම් පැවැත්වීම සඳහා මිල දී ගෙන තිබුණු "Board Pac" මෘදුකාංගය එම කටයුතු සඳහා යොදා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරා තිබුණු මුදල නිෂ්කාර්ය පිරිවැයක් බවට පත් වී තිබුණි.

(ඝ) එකතුව රු.1,218,834 ක් වූ සමාලෝචිත වර්ෂයේ මාර්තු මස මිල දී ගෙන තිබුණු ටැබ්ලට් පරිගණක 09 ක් පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුළ ඇතුළත්ව නොතිබුණු අතර අදාළ භාණ්ඩ නිකුත් කළ සහ ඒවා භාරගත් නිලධාරීන් පිළිබඳ තොරතුරු ගොනුගතකර නොතිබුණි.

(ච) කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.11,777,501 ක් වැයකර මිලදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 53 ක් ද ඇතුළුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැප්ටොප් පරිගණක 59 ක් පවතින බව ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වුවද, එදිනට ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, කොමිෂන් සභාව සතුව ලැප්ටොප් පරිගණක සංඛ්‍යාව 27 ක් බව වාර්තාකර තිබුණි. ඒ අනුව ලැප්ටොප් පරිගණක 30 ක ඌනතාවයක් පැවතුණි.

(ඡ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සඳහා ඉඩම් ලේඛනයක් සැකසීමේ අවශ්‍යතාවය මත සමාලෝචිත වර්ෂය තුළ දී රු.19,793,965 ක කුලී සහ ඉන්ධන පිරිවැයක් දරා කුලී කැබ් රථ 10 ක් ධාවනයේ යොදවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම් ලේඛනය සම්පූර්ණ කර නොතිබුණි.

(ජ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් 2016 දෙසැම්බර් 01 දින සිට 2017 නොවැම්බර් 30 දක්වා වසරක කාලයක් සඳහා බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික සමාගමකට අයත් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන තිබුණද, එම ගිවිසුම දීර්ඝ කිරීමකින් තොරව කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය එම ගොඩනැගිල්ලෙහිම පවත්වාගෙන එමින්, රජයේ තක්සේරු වටිනාකමට වැඩියෙන් රු.29,937,867 ක් ගෙවා තිබුණි.

(ට) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව ඉඩම් අක්කර 50 ට වැඩි ප්‍රමාණයක් හිමි පුද්ගලයන්ගේ ඉඩම් රජයට පවරා ගැනීම යටතේ 1972–1974 අතර කාලසීමාව තුළ ඉදිරිපත් කරන ලද ප්‍රකාශන 260 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 48 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද ව්‍යවස්ථාපිත නිශ්චය ලබා දීමට නොහැකි වී තිබුණි.

(ය) කළුතර දිස්ත්‍රික්කයේ හෑගල්ල වත්ත ඉඩමෙන් අක්කර 10 ක් තේ වගාකිරීමේ ව්‍යාපෘතියක් සඳහා එන්.බී.ආරියරත්න මහතාට බදු පදනම මත ලබා දීමට අංක 8393 හා 2013.04.30 දිනැති කොමිෂන් පත්‍රිකා තීරණයට අනුව සභාව කටයුතු කර තිබුණි. 2011 වසරේ සිට මෙම ඉඩමට අදාළ කිසිදු බදු මුදලක් අදාළ බදුකරු ගෙවා නොමැති අතර, වලංගු ගිවිසුමකට එළඹීමටද කටයුතුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කළ මූල්‍ය තත්ත්ව විස්තරය අනුව අයවිය යුතු රු.2,560,000 ක මුදල අයකර ගැනීමට හෝ ඉඩම පවරා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඩ) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) (ආ) වගන්තිය ප්‍රකාරව, ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලෙව්වම් ඩී වත්ත නැමැති ඉඩමෙන් අක්කර 08 ක් අවුරුදු 30 ක කාලයක් සඳහා වසර 5 න් 5 ට බදු සමාලෝචය කරමින් 2005 වර්ෂයේ තක්සේරු වටිනාකම මත 2005 වර්ෂයේ සිට "සහන ළමා සංවර්ධන පදනමට" බදු පදනම මත ලබා දීමට 2014 කටයුතුකර තිබුණු අතර, අදාළ ඉඩම සම්බන්ධයෙන් ගැටලුසහගත තත්ත්වයක් ඇති වූ බව පවසමින් ඉඩමේ භුක්තිය ඒකපාර්ශ්විකව කොමිෂන් සභාව වෙත 2021 වර්ෂයේදී පවරාගෙන ඇති බව විගණනයට වාර්තාකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට හිඟව පැවති රු.6,509,200 ක මුදල අයකර ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඪ) කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති හා විමර්ශන අධ්‍යක්ෂ, ව්‍යාපෘති සම්බන්ධීකාරක, විමර්ශන නිලධාරී, නීති උපදේශක සහ නීතිඥ යන සේවා, සේවා ගිවිසුම් මත රාජකාරී ඉටුකර ගැනීම සඳහා 14 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් බඳවාගෙන තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ සේවා ගිවිසුම්වලට එළඹීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි. ඒ අනුව නිශ්චිතව පවරන ලද රාජකාරියක් ඉටුකරවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.14,853,725 ක මුදලක් ගෙවා තිබුණි.

(ණ) සභාපති සහ විධායක අධ්‍යක්ෂ තනතුරු සඳහා නිවාස සහ සංග්‍රහ දීමනා සඳහා හිමිකමක් නොමැති වුවද, එයට පටහැනිව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.1,200,000 ක් නිවාස හා සංග්‍රහ දීමනා ලෙස ගෙවා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්මේ පිටපතක් ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ලබාදිය යුතු වුවද, කොමිෂන් සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 හි සඳහන් පරිදි කාර්තුමය කාර්ය සාධන වාර්තා කාර්තුව අවසන් වී දින 30 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්තුමය කාර්ය සාධන වාර්තා චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අංක අමප/18/1126/829/002 දරන 2018 ජූනි 27 දිනැති කැබිනට් මණ්ඩල තීරණය පරිදි කොමිෂන් සභාව වෙත වාර්ෂිකව සේවය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණු අතර, ඒ අනුව බඳවාගත් සේවකයින්ගෙන් 180 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විට සේවයකරමින් පැවතුණි. තවද, අදාළ බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාවේ ඇතුළත් මධ්‍යම කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 02 ක්, කළමනාකරණ සහකාර තනතුරු 07 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරක් පුරප්පාඩුව පැවතියද, අවශ්‍යතාවය පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හෝ පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති